සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

**පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය**

**I පත්‍රය**

**නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන**

# "අදිති"

# 8

පැය 01 යි

විභාග අංකය ..............................

**<u>විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්</u>**


- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

01. සරල හා වක්‍ර රේඛා දෙවර්ගය ම ඇති රූපය තෝරන්න.


1.


2.


3.

02. පහත දක්වා ඇති පළමු රූපයේ ඇති උපකරණ භාවිත කරමින් එහි ඇති ධාන්‍ය කොටා ගැනීමෙන් පසු පිටි හලා ගැනීම සඳහා භාවිතා කරන උපකරණ තෝරන්න.




1.


2.


3.

03. පහත රූපවලට අදාළ කාර්යයන් නිවැරදි ව පෙළ ගැස් වූ විට නිවැරදි පිළිතුර වනුයේ,


A


B


C


D

1. ABCD  2. BACD  3. BADC

04. කවියෙන් පැවසෙන කරුල්ලා කවුරුන් දැයි තෝරන්න.

***හිස මුදුනෙහි කොණ්ඩේ බඳින***
***ඒ නිසා ම නමක් හැදුන***
***ගෙවල් අසල නිතර සරන***
***කරුල්ලෙක්මි ඔබ හඳුනන***

1. මොනරා  2. කොණ්ඩ කුරුල්ලා  3. ගිරවා

05. මුලින් දී ඇති රූපයට සමාන බවක් දක්වන රූපය තෝරන්න.




1.


2.




3.

06. අද දින නිමල්ගේ මෝටර් රථයේ ගමන් අරඹන අවස්ථාවේ එහි දක්නට ලැබුණ මීටරයේ සඳහන් ව තිබුණු අගය මෙහි දක්වා ඇත. මෙම මෝටර් රථයේ සඳහන් ව ඇති දුරෙන් $\frac{3}{5}$ක් ඊයේ දිනයේ නිමල් ගමන් කළේ නම් ඔහු, ඊයේ සහ අද ගමන් කළ දුර වනුයේ,

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 0 | 0 | 1 | 5 | 0 | K | m |

1. 150 km     2. 240km     3. 140km

- **පහත දැක්වෙන ඡේදයේ රූපයකින් දක්වා ඇති ස්ථානයට ගැළපෙන නිවැරදි වචනය දී ඇති පිළිතුර අතුරින් තෝරා අංක 7 හා 8 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

**එක්තරා කැලෑවක**  **බඩගින්නේ කෑම සොයමින් එහා මෙහා ඇවිද්දේ ය. කැලය මැදට යනවිට වතුර පිරුණු වළක**  **සිටිනු දැක්කේ ය. වළ ළඟට ගිය නරියා ඌ සමඟ මුසා බස් දෙඩුවේ ය.**

07. දෙවන රූපයට ගැළපෙන වචනය කුමක් ද?

1. නරියෙක්     2. ඉබ්බෙක්     3. ඉබ්බෙකු

08. පළමු රූපයට ගැළපෙන රූපය කුමක් ද?

1. ඉබ්බෙක්     2. නරියෙකු     3. නරියෙක්

09. පහත සඳහන් කවියේ සඳහන්වන ධාන්‍ය වර්ගයේ නම වන්නේ,

***පදුරු ලෙසින් යසට වැඩෙන***
***පිටිකර පමණක් බුදිමින***
***විවිධ රසින් අහර සදන***
***ධාන්‍යයකි ඔබ හඳුනන***

1. තල     2. බඩඉරිඟු     3. කුරහන්

10. පන්තියේ වෙසක් කූඩු සෑදීමට මුදල් එකතු කරන ලදී. එකතු කරන ලද මුදල රු273.50කි. මෙම මුදල කාසි හා නොට්ටුවලින් එකතු වූ ආකාරය සඳහන්වන පිළිතුර තෝරන්න.

1. රුපියල් 100 ඒවා 1යි. රුපියල් 50 ඒවා 3යි. රුපියල් 10 ඒවා 1යි. රුපියලේ ඒවා 3යි,සත 50 ඒවා 1යි
2. රුපියල් 50 ඒවා 4යි. රුපියල් 20 ඒවා 3යි. රුපියල් 10 ඒවා 1යි. රුපියලේ ඒවා 2යි.සත 50 ඒවා 3යි
3. රුපියල් 50 ඒවා 2යි. රුපියල් 20 ඒවා 5යි. රුපියල් 10 ඒවා 6යි. සත 50 ඒවා 3යි. රුපියලේ ඒවා 2යි

11.

**මිනිසා**
**එළුවා**
**කොටියා**
**පලා මිටිය**

**ගඟ**

**එගොඩ**


ඉහත සටහන අනුව,

මිනිසෙක් කොටියෙකු, එළුවෙකු, සහ තම්පළා මිටියකුත් රැගෙන ගඟකින් එතෙර වීමට ගියේ ය. වරකට ඔරුවෙන් එගොඩ විය හැක්කේ දෙදෙනෙකුට පමණි. මිනිසා සමඟ සතුන් දෙදෙනා හීලෑ කමක් දැක්වුවත් , සතුන් දෙදෙනා අතර හීලෑ කමක් නැති හෙයින් එකිනෙතාගේ ජීවිත ආරක්ෂා වෙමින් ගැටලුවක් නොමැති ව ඉහත සියල්ල එගොඩට රැගෙන යාමට මිනිසාට කී වතාවක් ගඟ හරහා එහා මෙහා යාමට සිදු වේද?

1. 8 වතාවක්     2. 7 වාතාවක්     3. 6 වතාවක්

12. ඔබ ඉගෙනගත් තේරවිලිවලට අනුව වැස්සට පිනි බබා මෝරන්නේ කුමක් ද?

1. නෙලුම් මල     2. ඕලුමල     3. කැකුළු මල




**මෙම තීර ප්‍රස්තාරයෙන් දැක්වෙන්නේ පාසලක 5 ශ්‍රේණිය ඉගෙනුම ලබන සිසුන් 40 දෙනෙකු සිටින පන්තියක සතියක් තුළ පාසලට නොපැමිණි සිසුන් සංඛ්‍යාව ඇතුළත් ප්‍රස්තාරයකි. ඒ ඇසුරෙන් 13 හා 14 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**

13. ප්‍රස්තාරයට අනුව සිසුන්ගේ හොඳ ම පැමිණීම සටහන් වී ඇත්තේ කවදා ද?

1. බ්‍රහස්පතින්දා     2. සිකුරාදා     3. අඟහරුවාදා

14. අඟහරුවාදා දවසේ පැමිණි සිසුන් ගණන කීයද?

1. 35     2. 05     3. 38


15. පහත සඳහන් වාක්‍යයේ කොම්බුව, ඇලපිල්ල, සහිත හල් කිරීමේ ලකුණ සහ කොම්බුව සහිත ඇලපිල්ල යෙදුණු අක්ෂර ගණන පිළිවෙළින් කීය ද?

**කෝසල හේනට ගොස් කෝන් ගහෙන් කොටයක් කපා වංගෙඩියට ගැළපෙන මෝල ගහක් සෑදුවේ ය.**

1. 2, 3     2. 3, 2     3. 3, 3

16. 'ඉහේ මලක් පිපුණා' යන ඉඟි වැකියේ අර්ථයට ගැළපෙන විරුද්ධාර්ථ අර්ථයක් ලැබෙන පිළිතුර තෝරන්න.

1. දැඩි සතුටට පත් වීම  2. දැඩි දුකට පත්වීම  3. දැඩි බියකට පත්වීම

17. 


රූපයේ සටහන් කර ඇත්තේ නඳුල සහ යනුල තැබූ පා සටහන් ය. මෙම සටහන් හරහා නඳුල සහ යනුල ගමන් කරන්නේ එකක් හැර එකක්වන ආකාරයට ය. තමා පටන් ගන්නා තැනින් ගොස් නැවත ඒ තැනට ම එන ගමන් මාර්ග සරල රේඛා ඇඳීමෙන් අපට ලැබෙන හැඩ පවතින රූපය තෝරන්න.

1. අට පට්ටමක හැඩයකි.  2. තරුවක හැඩයකි.  3. ත්‍රිකෝණයක හැඩයකි

18. රටාව තේරුම්ගෙන A B හිස් කොටු දෙකට ගැළපෙන පිළිතුර පිළිවෙළින් තෝරන්න.


| | |
|---|---|
| 2 3 | 4 5 |
| 10 | 18 |

| | |
|---|---|
| 6 7 | 8 9 |
| 26 | 34 |

| | |
|---|---|
| 12 13 | 10 11 |
| A | B |

1. 42 50  2. 50 42  3. 50 41

19. රටාව සම්පූර්ණ වීමට අවශ්‍ය පිළිතුර තෝරන්න.




1. 10  2. 5  3. 25

20. මිහිරි ඉවතලන කිරි හට්ටි රවුමට තබා මල් සිටුවීමට රවුම් සකස් කළා ය. කිරි හට්ටි 36කින් රවුම් 3ක් සකස් කළේ නම් කිරි හට්ටි 72කින් සෑදිය හැකි රවුම් ගණන කීය ද?

1. 5  2. 6  3. 7

21. කවියේ හිස්තැන්වලට පිළිවෙළින් ඇතුළත් කළ හැකිනිවැරදි පිළිතුර තෝරන්න.


***ඉණේ තිබෙන ලිය ...................***

***ගෙදර තිබෙන ලිය ...................***

***ගසේ තිබෙන ලිය ....................***

***අතු අග තිබෙන ලිය ................***

1. හෙරලිය හැඹිලිය ඇතිළිය අරලිය
2. හැඹිලිය අරලිය ඇතිළිය හෙරළිය
3. හැඹිලිය ඇතිළිය හෙරලිය අරලිය

22. 

මුළු රූපයේ වටේ දිග අඳුරු කළ කොටසේ වටේ දිග මෙන් කී ගුණයක් ද?


1. 3  2. 4  3. 5

23. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

ගියේ ය/ කයි/ බැලුවේ ය/ නටයි/ ගැයුවේ ය.

1. ක්‍රියා පද ලෙස ය.
2. වර්තමාන කාල හා අතීත කාල පුරුෂ ලිංග ඒක වචන ක්‍රියා පද ලෙස ය.
3. අතීත කාල පුරුෂ ලිංග ඒක වචන ක්‍රියා පද ලෙස ය.

24. භාජන තුනකට ජල ප්‍රමාණයක් පහත ආකාරයට දමා ඇත. භාජන තුනේ ම ජල ප්‍රමාණය සමාන කිරීමට වඩාත් ම පහසු ක්‍රමය ඇතුළත් පිළිතුර තෝරන්න.




1. y සහ z භාජන දෙකෙන් x භාංනයට සමානවන ලෙස ජලය දැමීම.
2. z භාජනයෙන් x භාජනයට ජලය 150ml ක් දැමීම
3. x y z භාජන තුනේ ම ජලය විශාල භාජනයකට දමා භාජන තුනට ම සමාන ප්‍රමාණය බැගින් දැමීම.

25. රුපියලකින් $\frac{1}{100}$ ක වටිනාකම ඇති කාසිය වන්නේ,

1. සත 10 2. සත 1 3. සත 5

26. තල පෘෂ්ඨ දෙකකින් හා වක්‍ර කොටසකින් නිර්මාණය වී ඇති ඝන වස්තුව හඳුන්වන නම වනුයේ,

1. සිලින්ඩරය 2. බැරලය 3. චතුස්තලය

27. ''පරිසර ගෝලීය උෂ්ණත්වය වැඩි වී ඇත'' මෙයට හේතු විය හැක්කේ,

1. වෙනදාට වඩා හිරු එළිය පෘථිවියට වැටෙන නිසා ය.
2. මිනිසා විසින් කරන ලද පාරිසරික විනාශයන් නිසා ය.
3. සුළඟ සමඟ කුණාටු ඇති වීම ය.

28. අයියා පලතුරු කඩයෙන් දොඩම් ගෙඩියක් රු30.00 බැගින් ද ඇපල් ගෙඩියක් රුපියල් 35.00 බැගින් ද රුපියල් 320.00 ක් දී පලතුරු මිල දී ගත්තා ය. අයියා මිල දී ගත් දොඩම් හා ඇපල් ප්‍රමාණයන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,

1. 7, 3 2. 6, 4 3. 5, 5

29. හාල් ගෝනියක තිබු හාල් 72kg 750g කින් හාල් 30kg ක් විකුණු පසු ඉතුරු ප්‍රමාණය සමාන උර 3කට දමන ලදි. එක් උරයක ඇති සහල් ප්‍රමාණය කොපමණ ද?

1. 14kg 250g 2. 13kg 250g 3. 14kg 750g

30. කොටුව තුළ ඇති පළමු සංඛ්‍යාවෙන් $\frac{1}{4}$ ක් පළමුවන හිස්තැනට යෙදිය යුතු අතර, දෙවන සංඛ්‍යාව නවයෙන් බෙදා ඊට දහඅටක් එකතු කර දෙවන හිස්තැනට යෙදිය යුතුය. i හා ii යන හිස්තැන්වලට යෙදූ පසු සංඛ්‍යා 4හි එකතුව වන්නේ,

| | |
|---|---|
| 84 | 36 |
| .......... | .......... |
| i | ii |

1. 43　　2. 120　　3. 163


31. අන්තර් සම්බන්ධතාවයක් දැකිය නොහැකි වචන ඇතුළත් කොටුව තෝරන්න.

1. දබරය<br>දෝනාව<br>ඉල්ලම<br>පතල

2. මන්නඩිරාල<br>මාදැල්මඩිය<br>තෙප්පම<br>ඇම


3. යතු කැටය<br>බුරුමය<br>මනිස්ලෑල්ල<br>නියන

32. රූපයේ පාට කළ කොටස මෙන් කුඩා කැබලි කීයක් මෙවැනි විශාල හැඩතල 6කින් කපාගත හැකි ද?




1. 16
2. 96
3. 90

33. මෙම රූපයේ දක්වා ඇත්තේ සිරිල්ගේ ඉඩමේ දිග පළල පරිමාණ ගත කර ඇති රූපය සටහනකි. හදිසි මුදල් අවශ්‍යතාවයක් මත ඔහු රූපයේ දක්වා ඇති ආකාරයට අඳුරු කර ඇති කොටසක ප්‍රමාණයක් විකුණාන ලදී. ඉන් පසු ඔහුට ඉතුරු වූ කොටසේ කණු සිටුවා කම්බි වැට ගැසීමට අවශ්‍ය කම්බි ප්‍රමාණය පිළිබඳ නිවැරදි පිළිතුර වනුයේ,




1. මුලින් තිබූ ඉඩමේ වටේ දිග ප්‍රමාණයට සමාන දිගින් යුතු කම්බි ප්‍රමාණයක් අවශ්‍ය වේ.
2. මුලින් තිබූ ඉඩමේ වටේ දිග ප්‍රමාණයට 10m ක් වැඩියෙන් කම්බි අවශ්‍ය වේ.
3. මුලින් තිබූ ඉඩමේ වටේ දිග ප්‍රමාණයෙන් 10m අඩුවෙන් කම්බි අවශ්‍ය වේ.

34. ඉන්ධන අර්බුදයක් සමඟ මහජනතාව ගමන් පහසුව සලසා ගත් පරිසර හිතකාමී වාහනයක් වන්නේ,

1. යතුරු පැදිය　　2. කරත්තය　　3. පාපැදිය


35. මල්ලි කුමන වරදක් සිදු කළා ද තාත්තා ඔහු **මුරුංගා අත්තේ තබමින්** කතා කරයි. මෙහි ඉරි ඇඳි පදවල අර්ථය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. මුරුංගා අත්තේ තබා බිමට ගැනීම
2. රවටනු පිණිස වර්ණනා කිරීම
3. ස්ථිර තීරණයක නොසිටීම

36. පාසලක කාර්යාලය, බුදු මැදුරට දකුණු දිශාවෙන් ද, පුස්තකාලය, කාර්යාලයට හා බුදු මැදුරට උතුරු දිශාවෙන් පිහිටා ඇත. ක්‍රීඩා පිටිය පිහිටා ඇත්තේ පුස්තකාලයට නිරිත දිශාවෙනි. එසේ නම් පුස්තකාලය පිහිටා ඇත්තේ ක්‍රීඩා පිටියට කුමන කවර දිශාවෙන් ද?


1. බටහිර　　2. ඊසාන　　3. නැගෙනහිර

37. පහත රූපයේ දැක්වෙන්නේ සමාන ඝනක වෙන් වෙන ව ගෙන සාදන ලද පඩිපෙළකි. ඉහළට තවත් පඩියක් ඇත්නම් මුළු පඩිපෙළේ ම ඇති ඝණක ගණන කීය ද?



1. 24
2. 36
3. 40

38. මෙම ගණක රාමුවෙන් නිරූපණය වන අගයෙන් දස දහස ස්ථානයේ ස්ථානීය අගය අඩු කළවිට ලැබෙන පිළිතුර වන්නේ,



1. 5 0 5 2 4
2. 5 5 5 2 4
3. 6 4 5 2 4

39. නදුල පිටු 32ක් ඇති චිත්‍ර පොතක චිත්‍ර ඇඳීම ආරම්භ කළේ ය. ඔහු දිනකට පිටු තුනක පැන්සලෙන් චිත්‍ර අඳියි. එහෙත් ඒවා පාට නොකරයි. එසේ පසු දිනට ඇඳීමේ දී පෙර දිනයේ අවසනයට අඳින ලද පිටුවේ ඇති චිත්‍රය නැවත මකා පළමුව අඳින අතර, දිනකට අඳින පිටු ගණන ට මෙම පිටව ද ඇතුළත් වේ. ඒ අනුව ඔහුට චිත්‍ර පොතේ චිත්‍ර ඇඳ අවසන් ගිරීමට ගතවන දින ගණන කීය ද?

1. දින 14　　2. දින 16　　3. දින 15

40. පහත 1 හා 2 සිදුවීම් දෙස බලා සිදුවීමට ඉඩ ඇති දේ ඇතුළත් පිළිතුර තෝරන්න.

i. මුහුද පතුළේ සිදුවන භූමිකම්පා　　ii. සුනාමි තත්ත්වයන් ඇති වීම.

1. පළමු සිදුවීම නිසා දෙවැනි සිදුවීම බොහෝ විට සිදු වේ.
2. දෙවැනි සිදුවීම නිසා පළමු සිදු වීම සිදුවීමට වැඩි ඉඩක් පවතී
3. දෙවැනි සිදුවීම නිසා පළවැනි සිදුවීම අනිවාර්යෙන් ම සිදු වේ.